# විජය රජු ගැන මහාවංශයෙන්

විජය මුහුදු කොල්ලකරුවෙක්ද?

මහාවංශයට හා (මහාවංශටීකාව) අනුව ඉන්දියානු කාලිංග වංශික විජය යනු, පිතෘ ඝාතක සිංහබාහු නම් ස්වකීය සොයුරියම විවාහ කරගත් රජකුගේ පුත්‍රයෙකි. මහාවංශටීකාව අනුව සවෙනි පරිච්ඡේදයට අනුව විජය කවරෙක්ද යනු හොඳින් පෙන්වා දෙයි.

විජයෝ විසමාචාරෝ ආසි තම්පරිසා පිච<br>සාහසාකි අනෙකාසි දුස්සහානි කාරිම සුතේ – 39 ගාථාව

මෙම ගාථාව අනුව විසමාචාරෝ ආසි යනු – විකෘති අදහස් ඇත්තෝ යන්නයි. තම්පරිසාපිච යනු – ඔහුගේ පිරිස විකෘති අදහස් ඇත්තෝ යන්නයි. සහසාර්කි යනු – ස්ත්‍රී දූෂණ, මංපැහැරීම්, ගම පැහැරීම් වැනි සැහැසිකම් කරන්නෝ යන්නයි. මේ අනුව අපගේ මහාවංශය විජය නමැති දාමරික පව්වු අදම පුද්ගලයා පිළිබඳ පැහැදිලි හැඳින්වීමක් කර ඇත. මහාවංශය හා මහාවංශටීකාව මෙරට ඉතිහාසය මනා ලෙස පෙන්වන ඓතිහාසික වටිනාකමක් ඇති ග්‍රන්ථයක්ය.



ප්‍රසන්න වීරක්කොඩිගේ සිතුවමකි

සම්බජ තරේව දුතියං අහෝසි තතියං පන කුද්ධෝ මහාජ්නො අහපුත්තං සතෙහිතෙ ඉති. (40 ගාථාව)

“තමත්ථං පටිවේදයි” යනු එවන් සැහැසිකම් හේතුකොටගෙන මහජනයා උද්ඝෝෂණය කරමින් රජුට සැල කළහ. මේ අනුව පැහැදිලි වන්නේ මහජනයා ප්‍රතික්ෂේප කළ සමාජයට පිළිලයක් වූ පිය අවවාද පවා නොසලකා හැරි විජය පාපිෂ්ඨයකු බව නොවේද?

මහාවංශය නොතිබෙන්නට විජයගේ වර්ගය හෝ වංශයේ පැටිකිරිය අපට සොයාගත නොහැකි වනු ඇත. එබැවින් මහාවංශය පුරාවිද්‍යාත්මක මෙන්ම ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස පරිශීලනය ඉතිහාස ගවේෂකයන්ට අත්‍යාවශ්‍ය වේ. විජය පිළිබඳව මහාවංශයට අනුවම ඉන්දියාවෙන් පිටුවහල් කළ විජය ලංකාවට පැමිණ දහසය වියේ පසුවූ කුවේණි නම් (මහාපාලි කුමරිය) රවටා විවාහකොට ඇය අනාථභාවයට පත්කොට දරුවන් දෙදෙනෙක් ද සමග මහමඟට ඇද දමා තවද ලංකාද්වීපය පාලනය කළ මහාකාල යක් රජු ත්‍රස්තවාදී ගරිල්ලා ප්‍රහාරයකින් සිරිසවත්පු පුරයේදී මරණයට පත්කොට එම රජුගේම රාජකීය ආභරණ පැළඳගෙන තම්මැන්නාවේ සිට පුත්තලම ආශ්‍රිත ප්‍රදේශ යටත්කොට සිටි (අනුරාධපුර සුළු කොටසක් ඇතුළුව) ප්‍රභාකරන් හා සමානව රාජ්‍ය උරුමයක් නොමැති විකෘති මානසිකත්වයකින් හෙබි ආක්‍රමණිකයෙකි. ඔහු මෙරට ආදි රජු ලෙස හඳුන්වාදී ඔහුගෙන් සිංහලයන් පැවත එනවා යැයි ලංකා ඉතිහාසය උගන්වනු ලැබුවේ එවැනිම ආක්‍රමණික පිරිසක් වූ පෙරදිග රටවල් මංකොල්ලකෑ විජාතික සුදු ජාතිකයන්ය. නමුත් මෙරට රජු පෙලපත (ඇතැම් රජුන් හැර) අතීත හෙළ ජනයා විජය මෙරට ආදිතම රජු සේ කිසිවිටෙකත් මූලාශ්‍ර ග්‍රන්ථවලින් පෙන්වා දී නොමැත.

රොජෝ ච වරරොජෝ ච තථා කල්‍යාණකාදුවෙ

උපොසථෝ ච මන්ධාතා වරකොපවරා දුවේ

මෙම ගාථාවේ තේරුම වනුයේ මහාසම්මත රජුට අනතුරුව ඔහු පුත් රෝජ, රොජගේ පුත් වරරෝජ ආදී රජ පෙලපත මෙරට රජ කළ බවය. එබැවින් වංසතථපපකාසිනී ටීකාවේ 11 පරිච්ඡේදයේ පහත ගාථාව

මහා සම්මතරාස්ස වංසජෝ හි මහාමුනි

කල්ලාදිස්මිං හි රාජායි මහාසම්මතනාමකෝ

බුදුන් වහන්සේ මහා සම්මත වංශයෙන් උපන් බව සඳහන් කරයි. මහා සම්මත රජුගේ වංශය මහාසම්මත වංශයයි.

වංසතථපපකාසිනියට අනුවම අපට පෙන්වා දිය හැක්කේ විජය වැනි ආක්‍රමණිකයකු මෙරට ප්‍රථම රජු ලෙස කිසිවිටෙකත් ඉතිහාසය පිළිගැනීමට ලක් නොවී ඇති බවයි. ඉපැරණි රාවණා පෙළපතට අයත් පුස්කොළ ග්‍රන්ථ පරිශීලනයේදී විජය පෙළපතේ පැටිකිරිය හෙළිවේ. යක්ෂ ගෝත්‍රයේ ඇදවැටීම සඳහන් රක්ඛ ඉලෝතිලෝව පුරාණ පුස්තකය අනුව විජය යනු මුහුදු මංකොල්ලකරුවෙකි. ඔහු සහ අනුගාමිකයෝ ඉන්දියානු සාගරයේ වෙළෙඳ නැව් මංකොල්ලකෑමේ යෙදී ඇති අතර, මහාකාල හෙවත් කාලබද්‍ර හෙවත් සතිස්කාල රජ විජය ලක්දිවට පැමිණෙන විට මෙරට අනුරාධපුර ප්‍රදේශයේ රජුවේ.

උහුදාරක ප්‍රවේණියෙන සතිස්කාල රජත බලපතිවී
(උපුටා ගැනීම – පරිගපූර්ණිකාව පුස්කොළ ග්‍රන්ථය)
ඉපැරණි රක්ඛ ඉලෝවිලෝව පුස්කොළ ග්‍රන්ථයකට අනුව ලංකාවේ අනුරාධපුරයේ රජු කාලභද්‍ර වන අතර ලංකාවේ වෙළෙඳ නැව් මංකොල්ලකෑ විජය ඇතුළු ආක්‍රමණිකයන් කුවේණිය හෙවත් මහාපාලි නම් තරුණ රණකාමී සෙම්පතිනියක් යොදවා විජය ඇතුළු 700 ක් අත්අඩංගුවට ගනු ලබයි. බුද්ධ පරිනිර්වානය සිදුවී තිබුණ මේ යුගයේ මොවුන් එළිමහන් සිරකඳවුරක රඳවා තැබූ අතර, විජය සහ කුවේණි (මහාපාලි) හමුවූ පොකුණ අදත් මානැකන්දේ පුරාවිද්‍යාඥයන්ගේ අවධානයට ලක්නොවී විනාශ වෙමින් පවතී. මේ පොකුණ දැනට හඳුනා නැති රිටිගල පොකුණට වඩා විශාලත්වයෙන් වැඩිය. මෙම පොකුණ පිහිටි භූමිය රාවණා යුගයෙන් පසු නීලගිරිය ලෙස වරිගපූරණිකාවේ සඳහන්වේ. නිලගිරිදේශය (මානැව කඳුවැටිය) උපුටා ගැනීම යක්ෂ ගෝත්‍රිකයන්ගේ අප්‍රකට තොරතුරු – ත්‍රිපියවේදී මානැවේ විමලරතන හිමි,

කුවේණිය රවටාගත් විජය සිරිසවස්ථපුරයේදී කුවේණියගේ ද සහයෙන් කලාභද්‍ද මැරූ බව මහාවංශය තහවුරු කරයි. යම් යම් තොරතුරු එකඟවිය නොහැකි වුවත් විජයගෙන් සිදුවූ ආක්‍රමණයේදී යක්ෂ වංශයට බරපතල හානි සිදුවී ඇති බවට අපගේ පර්යේෂණ තුළින් තහවුරු වී ඇත. එබැවින් විජය යනු ලංකාවේ පාලනයට කිසිදු උරුමයක් නොමැති පරදෙස් ආක්‍රමණිකයෝ බව නොපැළිගැනීම ජාතියේ අවාසනාවකි. විජය පැමිණීමට ප්‍රථම මෙරට මිලේච්ඡ, වනචාරී, ගෝත්‍රික ජනයා විසූ බවට ප්‍රචාරය කරන ලද්දේ දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන්ගේ මතවාද හිස් මුදුනින් පිළිගත් ඇතැම් වංශ කථාකරුවන්ය. නමුත් විජය පැමිණීමට ප්‍රථම මෙරට උද්‍යාන, ප්‍රාසාද (දැවැන්ත මාළිගා), අක්ෂරක්‍රම, යානා තාක්ෂණ සහ චාරිත්‍ර වාරිත්‍ර, හෙළ සංස්කෘතිකාංග පැවැති බවට අප්‍රමාණ සාක්ෂි ඇත. රාවණ යුගයේ මහමෙවුනා උයන, මහාමේඝ වන උයන ලෙස හඳුන්වා ඇති අතර, එයට හේතුව වන්නේ රාවණාගේ දෙටුපුත් මේඝ නාද (උජේන්ද්‍රමිණික ලෙස රක්ඛ විජලකාව පුස්කොළ ග්‍රන්ථයක සඳහන් වේ.) මොහු උත්පත්තිය ලැබුවේ මෙම අලංකාර උද්‍යානයේය. එබැවින් මෙය මේඝ වනය නම් විය. මෙහි පිහිටා තිබූ කාල ප්‍රාසාදය විජය පැමිණෙන විට මෙරට පාලකයකු වූ මහාකාල යක් රජුගේ මාළිගාව පිහිටියේ ද මෙම භූමියේය. එ බව මහාවංශයේ කාල ප්‍රාසාදයක් ගැන හා මේඝ වනයක් ගැන ලියවී ඇති ගාථාවන්ගෙන්ම පැහැදිලිවේ.

තවද මහින්දාගමනය සිදුවන විට ශ්‍රී ලංකාවේ ගොඩනැඟිලි පැවැති බවට පැහැදිලි සාධක මහාවංශයෙන්ම පෙන්වා දිය හැක.

තං නන්දනා දක්ණේය නයං ථෙරං රථෙසහෝ
ඔහාමේඝවනුයනං පාචිනද්වාරකං නයි
තත්ථ රාජසරේ රම්මේ මඤ්චපීයානි සාධුකං

(උපුටා ගැනීම – මහාවංශය 15 පරි. 11 ගාථාව)
මහාමේඝ වනය හා මෙම රාජ ගෘහය පිළිබඳ ලිකිත සාධක මහාවංශයේම තිබීම ඉතිමහාසගවේශකයන්ට දේවානම් පියතිස්ස රජ යුගයේ ගොඩනැඟිSලි තිබූ බවට හා මේඝ වනය ලෙස හැඳින්වීම පිළිබඳ පැහැදිලි සාධකයකි.

මිහිඳු මහරහතන් වහන්සේට වාසස්ථානයක් ලෙස මුලින්ම ලබාදී ඇත්තේ ද මෙම රමණීය රාජගෘහය වීම ආශ්චර්ය ජනකය. මහාවංශය 15 පරි. 11, 13 ගාථාවන් අධ්‍යයනයෙන් මෙම තොරතුරු ලබාගත හැක.)

එබැවින් මිහිඳු මා හිමියන් මෙරටට පැමිණෙද්දී ද ගොඩනැගිලි නොපැවතියේ යැයි පුහු තර්ක මතු කිරීමට විජය පරපුරට නොහැකි වනු ඇත. මෙරට ආක්‍රමණික වූ විජය විසින් ඝාතනය කළ මහාකාල (කාලහද්‍ර රජු) පසුකාලීනව කාල ප්‍රාසාදය පිහිටි වර්තමාන ජයශ්‍රීමහා බෝධි වහන්සේ ද පිහිටා ඇති මෙම භූමියේ කළු බණ්ඩාර දේවතාවා ලෙස වන්දනා මානයට ලක්වීම මොනතරම් ආශ්චර්යජනකද? එබැවින් ඉරුගල් බණ්ඩාර (රවි ශෛලාස පරපුර) කාලහද්‍ර යක් රජු මරණින් පසු නෑයකුන් පිදීමේ සම්ප්‍රදාය අනුව යක්ෂ ගෝත්‍රිකයන් විසින් ජයශ්‍රීමහා බෝධි ආරක්ෂක දේවතාවා ලෙස ගෞරවාදරයට පත්කර ඇත. නමුත් අවාසනාවකට කළු බණ්ඩාර දේවතාවා එළාර රජු යැයි පවසමින් ඉතිහාසය නොදත් ලිපිකරුවන් විසින් සමාජයට හඳුන්වාදීම කෙතරම් අවාසනාවක්ද?

ජාතිය පාවාදීමක යෙදුණු ලාබාල වියේ පසුවූ කුවේණිය හෙවත් මහාපාලිය අවසානයේ අත්කරගත් ඉරණම ද යකුන් දෙස් තැබූ යක්දෙස්සාගල පුවතින් තහවුරුවේ. වර්තමාන කුරුණෑගල, විල්බාව ග්‍රාමයේ විලබාව රජමහා විහාරයේ පත්තිනි දේවාලය පිහිටා ඇති ගල්කුළු අසලදී කුවේණියගේ දිව කපා එක් අතුල් පහරින් මරණයට පත් කළ ප්‍රතාපවත් යක් පරපුරේ නරපතීහු විජයගේ දරුවන් පවා ජාතියට වැද්ද නොගත්හ. ජීවහත්ථ, දිසාලා ලෙස හඳුන්වන විජයට හා කුවේණියට දාව ඉපදුණු දරුවන් සමාජයට වැද්ද නොගත් යක්ෂ වංශය ඔවුන් සබරගිරි දේශයට පලවා හැරියහ. ඉන් පුලින්දයන් හෙවත් වැදි ජනයා ඇතිවූ අතර, විජාතික ලේ උරුම වැදි ජනයාගෙන් සිංහලයන් පැවත එනවා යැයි පුහුතර්ක ඉදිරිපත් කරන්නන්ට ද බටහිර ඉතිහාසය මත ඉදිරිපත් කරන්නට ද දිය හැකි පිළිතුර වන්නේ නොදියුණු වැද්දන්ගෙන් හෙළ ජාතිය නොපැවතුණු බවය. නමුත් වැදි ජනයා ඔවුන්ගේ මුතුන්මිත්තන් රන් ආභරණ පැළඳි, ප්‍රාසාදයන්හි ජීවත්වූ දියුණු ජාතියක් බව පෙන්වා දෙයි. එයට හේතුව වනුයේ කුවේණිය පාර්ශ්වයෙන් ජීවහත්ත, දිසාලාට ලැබුණු යක්ෂ ලේ උරුමය නිසාය. ඔවුන් මුතුන් මිත්තන් පිදීම (මළවුන් පිදීම) නෑ යකුන් පිදීම, බුදු දහම වැළඳ ගැනීම, යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ලැබුණු ආභාෂය තුළින් අද දක්වාම කරගෙන යනු ලබයි.

බටහිර ඉතිහාසකරුවන් මෙරට හෙළ ජන සමාජය වැද්දන්ගෙන් හා විජයගෙන් පැවත එනවා යැයි මෙරට අධ්‍යාපන ක්‍රමය තුළට එAත්තු ගන්වා ඇත. නමුත් ශ්‍රී රාවණා පරපුර කිසිවිටෙකත් මෙවැනි ඉතිහාසයකට පැවැත්මක් ලබා නොදෙනු ඇත. මුනිදාස කුමාරතුංගයන්, අරිසෙන් අහුබුදු සූරීන් ඉදිරිපත් කළ මත අනාගතයේ මොහොන්දේජාරෝ හරප්පා, සුමේරියානු, මෙක්සිකෝ, මායා ශිෂ්ටාචාර ඉතිහාසය මතුවීමත් වැළලී ගිය ශ්‍රී රාවණ ඉතිහාසය හා හෙළ යුගය මතුවීම ද කිසිවෙකුටත් නොවැළැක්විය නොහැක.

((ජලිත අමරසිංහ) 2009/11/18 – දිවයින)